# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2166/13 - 2020 මාර්තු මස 11 වැනි බදාදා - 2020.03.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු නගර සභා ආඥාපනතේ 184(1අ) වන වගන්තිය යටතේ පැවැත්වෙන පරීක්ෂණය

බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර විජේපාල ශ්‍රී නාරායන වාසල බණ්ඩාරණායක මොහොට්ටලාගේ සීතා කුමාරි අරඹේපොල වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු නගර සභා ආඥාපනතේ 184(1අ) වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, වත්තල මාබෝල නගර සභාව හා එහි සභාපති වශයෙන් කටයුතු කිරීමේදී ඉහත කී නගර සභා ආඥාපනතේ 184(1) උප වගන්තිය යටතේ දක්වනු ලබන වරදවල් සිදු කර තිබේද යන්න පරීක්ෂා කර මාස 3 ක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2152/14 හා 2019 දෙසැම්බර් මස 03 වන දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මගින් පත් කර ලද විශ්‍රාමලත් අභියාචනාධිකරණ විනිසුරු චන්ද්‍රදාස නානායක්කාර මැතිතුමාගෙන් සැදුම්ලත් ඒක පුද්ගල පරීක්ෂණ සභාවෙහි පරීක්ෂණ කාලය 2020 ජුනි මස 03 වැනිදා දින දක්වා මෙයින් දීර්ඝ කරනු ලබන බව නිවේදනය කරමි.

විජේපාල ශ්‍රී නාරායන වාසල බණ්ඩාරණායක
මොහොට්ටලාගේ සීතා කුමාරි අරඹේපොල,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2020 මාර්තු මස 02 වැනි දින,
බත්තරමුල්ල,
බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

03 - 931

1A - PG 4925 — 27 (2020/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*